

# භාෂා ප්‍රාඥයා

. එයාගෙයි

දුවයි, බෑනයි දෙන්නමත් වරින් වර ආව කොහොමද ලොක්ක ඉගෙන ගන්නෙ කියල බලා ඉන්න. මං හිතන්නෙ නැහැ ඒ ගොල්ලො වත් මේ පොත ගැන මොකවත් දන්නවද කියල. මිනිහ ඉගෙන ගන්න හැටි බලා ඉන්න එක ඒ දෙන්නට විනෝද ජනක වැඩක් වුණා. අනික මිනිහව මේ වගේ දේකට යොමු කරල පැත්තකට කරල තියෙන එකත් ඒ අයට කිසියම් අස්වැසිල්ලක් වගේ කියල මට දැනුනා....

. ඩොනා මරියා ඩා ග්ලෝරියා තමයි දුවගෙ නම. එයාගෙ සැමියා පළාතේ ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා. මිනිහට හැම තැනම සම්බන්ධකම් තිබුණා. මට ජාවා භාෂාව ගැන අවබෝධයක් තිබීම නිසා මිනිහ මට ලොකු ගෞරවයක් දැක්වුව. මිනිහ කිසිම පැකිලීමක් නැතිව හැමෝටම කියන්න මම ජාවා භාෂාව දන්නව කියල කියන්න. ඉතින් මහලු බැරන්වරයත් මගේ ඉගෙනීම ගැන සතුටු වෙලා. මාස දෙකකට විතර පස්සෙ මිනිහ මට කිව්වා, භාෂාව උගන්වන එක නවත්තල දවස ගානෙ පොතේ පිටුව බැගින් එයාට පරිවර්තනය කරන්න කියල......

මට ඕන මේක තේරුම් ගන්න විතරයි. මිනිහ කිව්වා. මිනිහ කියන එකත් හරි. කවුරු හරි පරිවර්තනය කරන දේ ඔහේ අහගෙන හිටියට වැඩේ ඉවරයි. මේ විදියට ගිහිල්ල පොත තේරුම් ගත්තම මිනිහගෙ වැඩේ හරි....

. ඉතින් දන්නවනෙ, තමුසෙ අද වෙනකලුත් මං දන්න ජාවා භාෂාවක් නැහැ. මම කළේ මොකක් හරි බොළඳ කථාවක් ගොතාගෙන ගිහිල්ල ඒක අර පොතේ තිබ්බ්ච එකක් හැටියට මිනිහ ඉදිරියේ ඇද බාන එක තමයි. මිනිහ ඒ බහුබූත කථා අහගෙන හිටියෙ හරියට දේවදූතයෙක්ගෙ මුවෙන් ගලා හැලෙන දෙයක් අහගෙන ඉන්නව වගේ භක්තියකිනුයි ප්‍රීතියකිනුයි.....

. මිනිහ මට ගේ ඇතුලෙ නවාතැන් දීල වෙනත් තෑගි බෝගත් දීල මාව සතුටු කළා. කොටින්ම කියනව නං මං බොහොම සුකුමාර ජීවිතයක් ගත කරන්න පුරුදු වුණා....

. මේකට තව හේතුවක් වුණේ, මෙච්චර කල් අමතක වෙලා හිටපු පෘතුගාලෙ ඥාතියෙකුගෙ උරුමයක් මිනිහට ලැබෙන පාටක් තිබුණ හින්දයි. මේ අර පොත තේරුම් ගත්ත නිසා බව මිනිහ තදින් විශ්වාස කළා. ඉතින් මමත් මිනිහගෙ විශ්වාසය තහවුරු කරන්න කථා බහ කළේ

පැනල.......

. මං මේ කරන වැඩේ ගැන කිසිම පසුතැවිල්ලක් හිතේ ඇති වුණේ නැහැ. හැබැයි මම බයේ හිටියෙ ජාවාවල පිටිසර පැත්තක කෙනෙක් කොහෙන් හරි මතුවේවි කියලා. මගේ බය තවත් වැඩිවුණේ මම ජාවා බස දන්නා නිසා තානාපති සේවයේ තනතුරක් පිරිනමන්න කියල බැරන්වරයා මගේ අතේම කරුරුවල විස්කවුන්ට් වරයාට භාර දෙන්න ලියුමක් දුන්න වෙලාවෙ. මම මේකට විවිධ හේතු දක්වල යන්න බැහැම කිව්වා. මගේ මූණ කැතයි. කිසිම පෙනීමක් නැහැ. වගේ ඒව. මොන...! මේ කිසිම එකකින් මිනිහව නතර කර ගන්න මට බැරිවුණා.....

'ඔයාට පිස්සුද මහත්තයා? ඔයා වගේ අය තමයි මේ තනතුරුවලට දාන්න ඕනි.' මිනිහ කියපි....
. බැරිම තැන මමත් මේ ලියුම අරන් විදේශ අමාත්‍යාංශයට ගියා. බොලේ වැඩේ හරි....

. අධ්‍යක්ෂවරයා අංශ ප්‍රධානියා කැඳවල කිව්ව, 'මෙන්න අපිට අන්තිමට ජාවා භාෂාව දන්න කෙනෙක් හම්බවෙලා කියල. ඊට පස්සෙ මාව ඒ ඔෆිස් එකේ වැඩ කරන හැමෝම ගාවට ගිහින් අඳුන්වල දුන්නා. ඒත් එක ක්ලාක් කට්ටෙක් නං මා දිහා බලා ගෙන උන්නෙ හරියට මාව කන්න වගේ. අනිත් කවුරුත් මං දිහා ලොකු ගෞරවයකින් බැලුව මතකයි. ඒ අය ඇහුවෙ 'ජාවා භාෂාව ඉගෙන ගන්න හුඟක් ආමාරුද? මෙහෙ නෑනේ ඔය භාෂාව දන්න කවුරුත්...'
. අර මං දිහා කන්න වගේ හිටපු එකා මගෙන් ටික වෙලාවකට පස්සෙ අහනව මහත්තය මං ජා භාෂාව නං දන්නෙ නැහැ. හැබැයි මං දන්නව කනකා භාෂාව. මහත්තය දන්නවද ඒක?...

. මං එකපාරටම නැහැයි කියල මිනිහව මග ඇරියා. ඊට පස්සෙ ඒගොල්ලො මාව ප්‍රධාන ඇමතිවරයා ගාවට එක්කල ගියා. මිනිහ නැගිටල මට අතට අත දුන්නා......

. මේ වගේ ජාවා භාෂාව දන්න හොඳ කෙනෙක් ඔය තනතුරට සුදුසු වැඩියි කියල මිනිහ කිව්ව. 'මං දෙන්නං ඔහේට ඔසිනියාවටම බලපාන කොන්සියුලේට් තනතුරක්. මේ දවස්වල නං ඒකෙ ඇබෑර්තු නැහැ. හොඳයි මං ඒකට පිළියමක් යොදන්නං. දැම්මම ඒකට යන්න පුළුවන්. ඒක තමයි, බාලේවලට ගිහින් භාෂා අධ්‍යයන සමුළුව නියෝජනය කරන එක.' කියලා....

. ඉතින් අර මහලු බැරන්වරය මිය ගියා. පොත භාර ගත්තෙ එයාගෙ බෑන. මිනිහ ඒක එයාගෙ මුනුපුරාට පවරාවි.....

. මං ඉතින් මේ අතරෙ ඇත්තටම ජාවා භාෂාව ඉගෙන ගන්න තැනක් හෙව්ව. හම්බ වුණේම නැහැ. මේ අතරෙ එක එක භාෂා අධ්‍යයන වාර සඟරා මම ගෙන්න ගත්ත. ඔය තියෙන්නෙ ඉතාලි -ඉංග්‍රීසි භාෂා අධ්‍යයන සංගමයේ සැසි වාර්තා. මානව භාෂාව අධ්‍යයන කවය. ඔය ඔක්කොම මහ මහ බහුබූත. ඒවගෙ ඇති කෙහෙල්මලක් නැහැ. ඒ අතර පොත් සාප්පු කාරයො ව්‍යාකරණ විශාරදයො සමහර පරිභාෂික වචන විග්‍රහ කරගන්න මගේ උපදෙස් පවා පැතුව. මට තවමත් සොන්ඩා දූපතේ පත්තරේකින් මගේ දැනුම ගැන ප්‍රශංසා කරල ලියුම එවනවා....

. හැබැයි ජාවා භාෂාව හදාරන ශිෂ්‍යයො වගේකට නං හම්බවෙන්න වේලාවක් දෙන්න බැහැ කිව්ව. ඒ වුණාට කර්තෘවරයාගෙ ආරාධනාව උඩ මම ජර්නල් ද කැමෙසියෝ සඟරාවට නූතන ජාවා සාහිත්‍යය ගැන ලිපියකුත් ලිව්වා....

'උඹ මාර යකෙක්නෙ.' මගෙ යාළුව අහනව. 'ජාවා භාෂාව ගැන කිසිම දෙයක් දන්නෙ නැතිව කොහොමද ලිපියක් ලියන්නෙ ඔය වගේ?'

. හරිම සුළු දෙයක්. මම ඉස්සර වෙලා කරන්නෙ ඔය විශ්වකෝෂෙ වගේ ඒව පෙරලලා ජාවා දූපත ගැන පොඩි විස්තරයක් කරන එක. ඊට පස්සෙ පුළුවන් තරම් ඒ සාහිත්‍යය ගැන පිට මිනිස්සු කිව්ව දේවල් ලිපියට ඇතුල් කරනවා .

. හැබැයි දවසක් නං මට කෙලවෙන්නම ගියා. පොලීසිය වතාවක් වෙරි වෙච්ච නාවිකයෙක් අත්අඩංගුවට අරගෙන. මිනිහ අමුතු භාෂාවක්ලු කථා කරන්නෙ. ඒ ගොල්ලො භාෂා පරිවර්තකයො ගොඩක් ගෙන්නල. මටත් එන්න කිව්ව. මං කළේ ටිකක් පරක්කු වෙලා එතෙන්නට ගිය එකයි. මං යනකොට යන්තං ඕලන්ද තානාපතිවරයා මැදිහත් වෙලා මිනිහ නිදහස් කර ගෙන. මොකද මිනිහ කථා කරපු භාෂාවෙ ඕලන්ද වචන කීපයක් තිබිල තියෙනවා. ඇත්තටම ඒකා ජාවා භාෂාව කථා කරන මිනිහෙක්ලු.....

. ඉතින් මාස හයක් ඇතුළත මාව හැවානාවල කොන්සල්වරයා විදියට පත් කරල යැව්ව. මම මේ පාර ආපහු ඇවිල්ල කොහෙන් හරි ජාවා භාෂාව ඉගෙන ගන්නයි බලා ඉන්නෙ. බලපන් බැරි වෙලාවත් ඔය දුන්න තනතුර ගැන අසතුටු වුණා නං මොකද මට වෙන්නෙ කියලා...?

'මොකක්ද උඹම කියපන්කො.' මගේ යාඹුවට කට ඇරගෙන ඒ ප්‍රශ්නය පෙරලා මගෙන්ම ඇහුව. මේ රටේ මොන බොරුවද කරන්න බැරි?' මට එහෙනං භූත විද්‍යාව ඉගෙනගෙන බැක්ටීරියා විද්‍යාඥයෙක් හැටියට ප්‍රසිද්ධ වෙන්නත් තිබුණා. අපි දැන් යමු.

*ඩබ් එච් උපසේන ගේ "එලොව ගිහින් මෙලොව ආ කෙනෙක්" කෙටිකතා සංග්‍රහයෙන්*

---

**8 වන පිටෙන්**

කියන ප්‍රශ්ණයක් තිබෙනවා. චැනල් විශාල සංඛාවක් තිබෙනවා. අඩුම තරමින් ගීයක් වෙනුවෙන් රෝයල්ටිය ගෙවන්නේ නැහැ. කලාකරුවන් ආරක්ෂා වෙන ක්‍රමයක් නැහැ. වෙනත් රටවල එහෙම නෙවෙයි. කලාකරුවන් එකම වේදිකාවකට එන්නේ කවදාද එදාට එතන මමත් ඉන්නවා. නමුත් එහෙම වෙයිද කියන එක මට කියන්න බෑ. ප්‍රශ්ණ ගොඩක් තිබෙනවා. මම ප්‍රාර්ථනා කරනවා අනාගතයේදී රටට ආදරේ කරන ශීලාචාර හැදිච්ච ගුණගරුක ප්‍රතිපත්තිගරුක මිනිසුන් මේ රටේ දේශපාලනයට එක්වේවා කියලා.

**මෑත කාලයේ ඔබේ නව ගී නිර්මාණ, රසික මනසේ රැදෙන ගී නිර්මාණවල යම් අඩුවක් තිබෙන බවක් පේනවා.**
කිසිම අඩුවක් නැහැ. රටේ මිනිස්සු සින්දු අහන්නේ නැහැ. රටේ චැනල් සින්දු දාන්නේ නැහැ. 2010 මම සුදු හංසිණී සීඩී එක නිකුත් කළා. මම කළ දෙයක් නිසා කියනවා නොවෙයි. මෙහි තිබුණේ විඳින්න පුලුවන් නිර්මාණ. මිනිස්සුන්ගේ කන් කුණු කරන නිර්මාණ නොවෙයි. ඒ තැටියේ ගීත පහක් අද ඉතාම ජනප්‍රිය වෙලා තිබෙනවා. රන් සමනළියක ඇගේ මුහුණේ, මේ දුකම මිහිරියි, රාත්‍රිය, මාගේ දේශය. මෙතන වෙලා තියෙන්නේ නාලිකාවල ප්‍රශ්ණය මිස කලාකරුවන්ගේ ප්‍රශ්ණයක් නොවෙයි. දැන් ෂති දෙකක් වෙනවා මම අලුත්ම ගී දෙකක රූප රචනා දෙකක් සෑම මාධ්‍යයකටම ලබාදුන්නා. අද වෙනකම් එකක්වත් ප්‍රචාරය වුණේ නෑ. හැමදේකටම යම් කිසි ඉන්ජෙක්ෂන් එකක් ගහන්න ඕනේ ක්‍රියාත්මක වෙන්න. රසිකයන් හිතන්න පුලුවන් අපි නිර්මාණ බංකොලොත්භාවයට පත්වෙලා කියලා. එහෙම එකක් නෙවෙයි. කරන නිර්මාණ රසිකයන් අතරට ගෙනයන්නට ක්‍රමවේදයක් නැහැ. සල්ලිවලට තමයි යන්නේ. සල්ලි වියදම් කරන්න පුලුවන් නම් ඔයාටත් පුලුවන් සින්දුවක් කරලා ඒක ටොප් චාර්ට් එකේ එකට දාගන්න.

**මේ ප්‍රශ්ණයට විසදුමක් ඔබ දකිනවාද?**
නීතියෙන් තමයි විසදුමක් ලැබෙන්න ඕනේ.
ඔබ ක්ෂේත්‍රයට පිවිසි මුල් කාලයේ රංගනයට එක්වුණා. ඇයි රංගන ශිල්පිණියක් විදිහට ඉදිරියට ආවේ නැත්තේ?
ඒකට මට අවස්ථා දෙකක් ලැබුණා. කේරළයේ කෙටි චිත්‍රපටියක ගුරුවරියකගේ චරිතයකට ආරාධනයක් ලැබුණා. මම ඒක බාරගත්තේ නැහැ. පුළුවන් දේ කරගෙන ඉන්නවා කියලා හිතුවා.

**සංගීතය කියන විෂය පිළිබඳ විවිධ නිර්වචන තිබෙනවා. දිගු කාලයක් සංගීත ක්ෂේත්‍රයේ නියැළී සිටින ඔබ සංගීතය විග්‍රහකරන්නේ කොහොමද?**
සංගීතය කියන්නේ යහපත් සිතිවිලිවල ගලායාමක්.

**සංගීතය උගන්වන්න බැහැ කියලා මතයකුත් සමහරු දරනවා?**
සංගීත විෂයය උගන්වන්න පුලුවන්. නමුත් එතනින් එහාට යන්න පුලුවන් වෙන්නේ කලාකරුවෙකුට විතරයි. හදලා හදලා හදලා සංගීත තරු ගේන්න බැරි ඒකයි. කොතනක හරි ඒවගේ තරු කඩන් වැටෙනවා.

**කලාව, සුරාව සහ නුරාව අතර සමීප සම්බන්ධතාවක් තියන බවට මතයකුත් ජනතාව අතර තිබෙනවා?**
ඒ මතය තුළ මම නැහැ.

**අපි පෞද්ගලික ජීවිතය පිළිබඳ කතා කළොත්**
දැනට මම අම්මව බලාගෙන පවුලේ අනෙක් අයටත් විය යුතු යුතුකම් ඉටු කරගෙන ජීවත්වෙනවා. ඇත්තටම මට හොඳම හොඳ ස්වාමි පුරුෂයෙක් ලැබුණොත් මම අනිවාර්යෙන් විවාහ වෙනවා. මගේ අප්පච්චිගේ හැසිරීම දැක්ක ආදරණීය දුවෙක් මම. සෘජු ගතිය, සෞම්‍ය ගතිය වගේම අම්මට දක්වපු ආදරය.... ඇත්තටම ඒවා දැකපු දුවෙක් විදිහට මට නොහැකි වුණා මට සුදුසු ඉතාම හොඳ කෙනෙකු සොයාගන්න.

**ශිල්පිනියක් විදිහට ඔබගේ ඉදිරි වැඩ කටයුතු කොහොමද සැළසුම් වෙලා තිබෙන්නේ?**
පසුගිය කාලයේ ලැබුණු ඇරයුම් කිසිවක් හරියට කරන්න බැරිවුණා. මගේ වසර විසිපහක මතක එක්කළ ප්‍රසංගය තමයි සුදු හංසිනී. කීප වතාවක්ම නෙළුම් පොකුණ, මහරගම සහ තවත් තැනෙක ශාලා වෙන්කිරීමට සංවිධායකයන් මුදල් බැදලා තිබෙනවා. මම සූදානම් නැති නිසා කෙරුණේ නැහැ. මේ මාසේ ඕස්ට්‍රේලියාවෙදි නන්දා මාලිනී මහත්මිය සමඟ කරන ප්‍රසංගය මට සුවිශේෂී එකක්. මේ වෙනකොට එහි ටිකට් සියල්ලම විකිණිලා කියලා මට දැනගන්න ලැබුණා. ලබන අවුරුද්දේ නැවතත් මගේ ඒක පුද්ගල ප්‍රසංගයකින් ඕස්ට්‍රේලියාවට මම එන්න පුලුවන්. ඉදිරියේදී ලංකාවෙදිත් මෙවැනි ප්‍රසංගයක් තියන්න ඉල්ලීම් ලැබෙනවා. අපි බලමු.

කතා බහ
**ශ්‍රීලාල් සෙනෙවිරත්න.**